රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අංක 10 ✓

# රජයේ අනුග්‍රහය ලත් සංස්ථාවල/මණ්ඩලවල සේවය සඳහා මුදාහරින ලද රජයේ සේවකයන්ගේ නිවාඩු වරප්‍රසාද


රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුව
ටොරිංටන් චතුරශ්‍රය
තැ.පෙ. 1699
කොළඹ 7



ආයතන චක්‍රලේඛ මාලා අංක 2

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

මිළ : ශත 10 යි

තැපැල් ගාස්තුව : ශත 10 යි

## රජයේ අනුග්‍රහය ලත් සංස්ථාවල/මණ්ඩලවල සේවය සඳහා මුදහරින ලද රජයේ සේවකයන්ගේ නිවාඩු වරප්‍රසාද

රජයේ අනුග්‍රහය ලත් සංස්ථාවල/මණ්ඩලවල සේවය සඳහා මුදහරිනු ලැබූ කවර ශ්‍රේණියක වුව රජයේ සේවකයන්ට, ඔවුන් එම සංස්ථාවල/මණ්ඩලවල සේවයේ යෙදී සිටින කාලය තුළදී රජයේ සේවකයන් වෙත අදාල මුදල් රෙගුලාසිවල විධිවිධාන යටතේ නිවාඩු වරප්‍රසාද සඳහා සුදුසුකම් නො ලැබේ. එම කාලය තුළදී, එම සංස්ථාවල/මණ්ඩලවල නිවාඩු රෙගුලාසිවලට අනුකූලව නිවාඩු උපයාගැනීමට ඔවුන්ට සිදුවන අතර, එම සංස්ථාවල/මණ්ඩලවල සේවයේ යෙදීමට පෙර ඔවුන් විසින් උපයාගනු ලැබූ නිවාඩුවලට කිසිදු හිමිකමක් ද එම කාලය තුළදී ඔවුන්ට නො ලැබේ. එමෙන්ම, ඔවුන් පෙරළා රාජ්‍ය සේවයට පැමිණීමේදී ද සංස්ථාවල/මණ්ඩලවල සේවයේ යෙදී සිටි කාලය තුළදී උපයාගනු ලැබූ කිසිදු නිවාඩුවකට හිමිකමක් ඔවුන්ට නො ලැබෙනු ඇත. ඔවුන් එම සංස්ථාවෙහි/මණ්ඩලයෙහි සේවයේ යෙදී සිටියදී උපයා ඇති නමුත් ප්‍රයෝජනයට ලබා නොගත් කිසියම් නිවාඩු, ඉකුත්වූ නිවාඩු ලෙස සලකනු ලබන අතර, ඔවුන්ට හිමිව තිබෙනුයේ ඔවුන් සංස්ථාවලට/මණ්ඩලවලට බැඳීමට පෙර රජය යටතේ සේවය කළ කාලය තුළදී ඔවුන් විසින් උපයනු ලැබූ නිවාඩු පමණක් වනු ඇත.

සංස්ථාවල/මණ්ඩලවල සේවය සඳහා දැනට මුදහැර සිටින සියලුම රජයේ සේවකයන්ගේ අවධානයට මේ චක්‍රලේඛයෙහි අන්තර්ගත කරුණු ලක්කරනු ලැබිය යුතුය. එමෙන් ම, මෙය එබඳු සියලුම නිලධාරීන්ට, ඔවුන් මුදහරිනු ලබන අවස්ථාවේදී පැහැදිලි කරදිය යුතු වේ.

මේ චක්‍රලේඛයේ අන්තර්ගත කරුණු තම අමාත්‍යාංශය යටතේ පවත්නා සියලුම සංස්ථාවල/මණ්ඩලවල අවධානයට ලක්කරන ලෙස ස්ථිර ලේකම්වරුන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

අ.ක./එච්. එස්. වනසිංහ,
රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල්.

ආයතන අධ්‍යක්ෂ.

1970 සැප්තැම්බර් මස 18 වැනි දින,
163/1/69 (එල්/එල්).

1—ෂේ 2735—500 (3/71)